කවරෙකු නායකයකුට පක්ෂපාතීව දිවුරුම් දී අතට අත දී තම හදවතේ සාරය ද (අවංකභාවය) ඔහුට පිරිනැමුවේද ඔහු තමන්ට හැකි පමණින් ඔහුට අවනත විය යුතුය. වෙනත් කිසිවකු හෝ ඔහු සමග ගැටුම් ඇති කිරීමට පැමිණියේ නම් එම පිටස්තරයාගේ හිස නුඹලා ගසා දමනු.

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. අපි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග ගමනක් ගොස් එක් ස්ථානයකට ගොඩ බැස්සෙමු. අප අතරින් ඇතැමුන් කූඩාරම් සකස් කරමින් ද ඇතැමුන් දුනු හී තරඟ පවත්වමින් ද සිටි ඔහු අතර තවත් ඇතැමුන් සතුන් තණ බුදින්නට දක්කාගෙන යමින් සිටියෝය. එවිට අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) නිවේදකයෙක් සලාතය සඳහා රැස්විය යුතු බවට නිවේදනය කළ විට අපි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වටා රැස් වූයෙමු. එවිට එතුමා: “මට පෙර සිටි සෑම නබිවරයෙක්ම තම අනුගාමිකයන්ට යහපතක් වන බව හඳුනන දෑ වෙත ඔවුනට මඟ පෙන්වීමටත් ඔවුනට අයහපතක් වන බව හඳුනන දෑ ගැන ඔවුනට අනතුරු ඇඟවීමටත් මිස වෙනත් කරුණකට බැඳී සිටියේ නැත. සැබැවින්ම නුඹලාගේ මේ සමූහයා වනාහි, එහි පැවැත්මේ මුල් අවධිය ආරෝග්යමත් කළේය. නමුත් එහි පැවැත්මේ අවසන් අවධියේ පරීක්ෂාවන් සහ නුඹලා පිළිකුල් කරන කරුණු සිදු වනු ඇත. එම පරීක්ෂණ එකින් එක සිහින්ව පැමිණෙනු ඇත. එම අර්බුධය පැමිණ විට, දේවත්වය විශ්වාස කරන්නා: ‘මෙය මාගේ විනාශය ගෙන දෙන්නක්’ යැයි පවසනු ඇත. එහෙයින් කවරෙකු නිරයෙන් ඉවත් කරනු ලැබ ස්වර්ගයට පිවිසීමට ප්රිය කළේ ද ඔහු අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරමින් සිටින තත්ත්වයේ ඔහුගේ මරණය ඔහුට පැමිණීම ප්රිය කළ යුතු වේ. ඔහු වෙත දෙනු ලැබීමට
ඔහු ප්රිය කරන දෑ ජනයා වෙත ද ගෙන ආ යුතු වේ. කවරෙකු නායකයකුට පක්ෂපාතීව දිවුරුම් දී
අතට අත දී තම හදවතේ සාරය ද (අවංකභාවය) ඔහුට පිරිනැමුවේද ඔහු තමන්ට හැකි පමණින්
ඔහුට අවනත විය යුතුය. වෙනත් කිසිවකු හෝ ඔහු සමග ගැටුම් ඇති කිරීමට පැමිණියේ නම්
එම පිටස්තරයාගේ හිස නුඹලා ගසා දමනු.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

යහපත වටහා දීම, ඒ සඳහා උනන්දු කරවීම, ඒ වෙත මිනිසාට මඟ පෙන්වීම මෙන්ම නපුර වටහා දීම, ඒ ගැන අවවාද කිරීම යනාදී නබිවරුන්හට අනිවාර්යය වූ කරුණු දහම වෙත ඇරයුම් කරන්නන්හටත් අනිවාර්යය වන බව මෙම හදීසයේ සඳහන් වී ඇත. එමෙන්ම මෙම සමූහයා ආරම්භ කාලයේ යහපත ලැබූ අතරම දැවැන්ත පරීක්ෂණවලින් ආරෝග්යමත් වූ බවත් මෙම ප්රජාවේ අවසන් අවධියේ නපුරුකම් හා පරීක්ෂණ ඇති වන බවත් සඳහන් වී ඇත. පැමිණෙන අර්බුද පෙර පැවැති අර්බුදවලට වඩා සැහැල්ලු නොවන්නේය. ඉන් මිදීමක් ඇත්තේ ඒකදේවත්වය විශ්වාස කිරීම, නබි තුමාගේ චරිතය පිළිපැදීම, මිනිසුන් සමග දැහැමි ලෙස ගනු දෙනු කිරීම, පාලකයාට ප්රතිඥා දීමට බැඳී සිටීම, ඔහුට එරෙහිව නැගී සිටීමෙන් වැළකීම, මුස්ලිම් සමූහයා වෙන් කරන්නට බලන්නන් නසා දැමීම යනාදිය තුළිනි.

http://www.sunnah.global/hadeeth/si/show/5345